**අප රටේ පසුගිය සති කිහිපය තුළ පරිසර විනාශය ගැන විරෝධයක් මතු වී තිබේ. තමන්ගේ විරෝධය නව ලිබරල්වාදයට එරෙහි වීමකැයි එම විරෝධයට සම්බන්ධ වන අය ප්‍රකාශ කරන බවක් මම නොදනිමි. ඔවුන් එය ඍජුව ප්‍රකාශ නොකළත්, වන විනාශයට විරුද්ධ වෙමින්, පරිසරය රැකගැනීමට සටන් කිරීම, නව ලිබරල්වාදයට එරෙහි අරගලයේම කොටසකි.**

නව ලිබරල්වාදයට එරෙහි වීම පසුග ිය කාලයේ ලෝකයේ නොයෙක් ආකාරවලින් සිදුවී තිබේ. මීට අවුරුදු දහයකට පෙර, එනම් 2011දී, ඇමරිකාවේ ආරම්භ වී, යුරෝපයටද ව්‍යාප්ත වූ ‘වෝල් වීථිය අල්ලාගනිමු’ (ධජජමචහ ්කක ීඑරුැඑ) නම් විරෝධතා ව්‍යාපාරය වෙතින් එක් එරෙහි වීමේ මාදිලියක් යෝජනා විය. එනම් ප්‍රසිද්ධ උද්ඝෝෂණ සහ විරෝධතා ව්‍යාපාර සහ ‘මහපාරේ කරන ක්‍රියාකාරකම්’ තුළින් නව ලිබරල්වාදී ප්‍රතිපත්තිවල අයහපත්, විනාශකාරී සහ හානිකර ප්‍රතිඵල ලෝකයට අනාවරණය කිරීමයි. ‘වෝල් ස්ට්‍රීට්’ යනු නිව්යෝක් නගරයේ කොටස් වෙළෙඳපොළ, අතිවිශාල බැංකු සහ මහා පරිමාණ මූල්‍ය සමාගම් පිහිටා තිබෙන වීථියයි. ලෝකයේ මූල්‍ය ධනවාදයේ මධ්‍යස්ථානය එයයි. වෝල් වීථියට එරෙහිව පෙළපාලි යෑම සංකේතමය වශයෙන් මූල්‍ය ප්‍රාග්ධනය විසින් ඉදිරියට තල්ලු කරනු ලබන ලෝක ධනවාදයේ නව ව්‍යාප්තියටත් එහි ප්‍රතිඵලවලටත් ප්‍රසිද්ධියේ එරෙහි වීමකි. ‘වෝල් වීථිය අල්ලා ගනිමු’ ව්‍යාපාරය විසින් අවධානය යොමු කරනු ලැබුවේ නව ලිබරල්වාදය විසින් උග්‍ර කරන ලද සමාජ සහ ආර්ථික අසමානතායි. එම අසමානතා උත්සන්න වීම රටවල් ඇතුළතද, රටවල් අතරද සිදු වී ඇත. විශාල ව්‍යාපාරිකයන් ලාභ ඉහළ නැංවීමට දක්වන ගිජුකම, ආණ්ඩුවල ප්‍රතිපත්ති වෙනස් කිරීමට එම සමාගම් කරන අසාධාරණ බලපෑම්, ව්‍යාපාර ලෝකයේ මෙන්ම ආණ්ඩු තුළද සිදුවන මහා පරිමාණ දූෂණය සහ වංචා සහ විශාල වශයෙන් සිදුවන පරිසර විනාශය මේ ව්‍යාපාරය විසින් අවධාරණය කරන ලද නව ලිබරල්වාදයේ අනෙකුත් විනාශකාරී ප්‍රතිඵලයි.

අප රටේ පසුගිය සති කිහිපය තුළ පරිසර විනාශය ගැන විරෝධයක් මතු වී තිබේ. තමන්ගේ විරෝධය නව ලිබරල්වාදයට එරෙහි වීමකැයි එම විරෝධයට සම්බන්ධ වන අය ප්‍රකාශ කරන බවක් මම නොදනිමි. ඔවුන් එය ඍජුව ප්‍රකාශ නොකළත්, වන විනාශයට විරුද්ධ වෙමින්, පරිසරය රැකගැනීමට සටන් කිරීම, නව ලිබරල්වාදයට එරෙහි අරගලයේම කොටසකි. ලංකාවේ වනාන්තර සහ හිස් ඉඩම් විශාල ප්‍රමාණයෙන්, නව-ලිබරල්වාදය යටතේ අලුතින් බිහිවී තිබෙන ව්‍යාපාරික පන්තියේ සාමාජිකයන්ට වාණිජ සහ නිර්යාත කෘෂිකර්මය සඳහා වර්තමාන ආණ්ඩුව විසින් විකිණීම සහ බදුදීම, නව-ලිබරල්වාදී සංවර්ධන මූලෝපායේම අංගයකි. ඉන්දියාවේ, ඉන්දුනීසියාවේ, මලයාසියාවේ සහ බ්‍රසීලයේද, අප්‍රිකානු තහ ලතින් ඇමරිකානු රටවලද සිදුවන්නේ ව්‍යාප්ත වන මූල්‍ය ප්‍රාග්ධනයේ සහ වෙළඳාමේ අවශ්‍යතා වෙනුවෙන්, විශාල ව්‍යාපාරිකයන්ගේ ලාභ ඉහළ දැමීම සඳහා, ධනවාදයේ පොරොවට තවමත් හසු නොවූ භූමි ප්‍රදේශ ප්‍රාග්ධනයේ සහ ව්‍යවසායකයන්ගේ ආධිපත්‍යයට ගැනීමයි. වාණිජ ප්‍රාග්ධනයේ ආක්‍රමණය දැන් මුහුද වෙරළේ සිට වනාන්තර වෙතට ගොස් තිබේ. නව ලිබරල්වාදී දැක්ම විසින් මෙහෙයවනු ලබන ලෝක ධනවාදය, භූමිතලයේත්, මනුෂ්‍ය ශිෂ්ටාචාරයේත් පැවැත්මට තර්ජනයක් වී ඇතැයි සමහර පරිසරවේදීන් පවසන්නේ ඒ නිසාය. ‘වඳවීමට විරෝධය පෑමට එරෙහි කැරැල්ල’ (ෘංඑසබජඑසදබ ඍැඉැකකසදබ) යනුවෙන් ලෝකයේ බොහෝ නගරවල ව්‍යාප්ත වූ සාමකාමී විරෝධතා ව්‍යාපාරයද, නව ලිබරල්වාදයට එරෙහිව පරිසරවේදීන්ගෙන් එල්ලවූ සවිඥානික ප්‍රතිචාරයකි.

# විවිධ ප්‍රතිචාර

මේ අතර, සමහර රටවල්ද නව ලිබරල්වාදයට එරෙහි වීමේ හෝ එහි විපාකවලින් ආරක්ෂා වීමේ ක්‍රියාමාර්ග ගෙන ඇත. ඇමෙරිකාවේ, බ්‍රිතාන්‍යයේ පසුගිය අවුරුදු කිහිපය තුළ වර්ධනය වූ, ආණ්ඩු විසින් ක්‍රියාත්මක කරන ලද ආර්ථික ආරක්ෂණවාදය එක් නිදසුනකි. ඇමෙරිකාවේ හිටපු ජනාධිපති ට්‍රම්ප් හා බ්‍රිතාන්‍යයේ වර්තමාන අගමැති බෝරිස් ජොන්සන්, නව ලිබරල්වාදය තුළම හිඳගෙන ආර්ථික ආරක්ෂණවාදය ඉදිරියට දැමූ පාලකයෝය. ධනවත් ධනවාදී රටවල්වල ආර්ථික ආරක්ෂණවාදය සහ ආර්ථික ජාතිකවාදය මතු කිරීම නව-ලිබරල්වාදයට එම රටවල පාලකයන් දක්වන එක් ප්‍රතිචාරයකි.

මේ අතර, ලංකාවේ පොදුජන පෙරමුණු ආණ්ඩුවද, තමන්ටම ආවේණික ආකාරයට නව ලිබරල්වාදය විවේචනය කරමින්, නව-ලිබරල්වාදී ආර්ථික ප්‍රතිපත්තිවලට විකල්ප සොයමින් සිටී. ආර්ථික ආරක්ෂණවාදය සහ ආර්ථික ජාතිකවාදය යන මතවාද ආණ්ඩුවේ නව ආර්ථික ප්‍රතිපත්තිවල ලක්ෂණයකි. ලෝක වෙළෙඳ පොළ සමග තිබෙන වාණිජ සම්බන්ධතා සීමා කරමින්, 1970 කාලයේ පැවැති රාජ්‍ය ධනවාදය කරා යාම, ආණ්ඩුවේ ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්තිමය තෝරා ගැනීම බව පෙනේ.

අප ඉහත සඳහන් කළ නව-ලිබරල්වාදයට ඇති එරෙහිවීමේ ක්‍රියාමාර්ගවල එක් පොදු ලක්ෂණයක් තිබේ. එය නම්, ඒ සියල්ල ධනවාදී ක්‍රමය ඇතුළතම සිදුකරන මතුපිට විවේචන මත විවිධ මට්ටම්වලින් ගොඩනගනු ලැබූ මෘදු එරෙහිවීම් වීමයි. ඒ කවුරුන් හෝ ධනවාදය පිළිබඳ ප්‍රශ්නය මතු කරන්නේ නැත. ලෝකයේ දැනට තිබෙන කොමියුනිස්ට් පක්ෂ පවා නොකරන දෙයක්, එනම් ගෝලීය ධනවාදයට එරෙහිව කම්කරු පන්තිය පෙළගැස්වීම, ධනවත් රටවල ජාතිකවාදී/ජනකාන්තවාදී පාලකයන්ගෙන්, මධ්‍යම පන්තික සිවිල් සමාජ ක්‍රියාකාරිකයන්ගෙන්, රාජ්‍ය ධනවාදී ආර්ථික විද්‍යාඥයන්ගෙන් හෝ ජාතිකවාදී දේශපාලන නායකයන්ගෙන් හෝ අපේක්ෂා කළ නොහැකිය. ලෝකයේ කම්කරු පන්ති සමාජවාදී ව්‍යාපාරයක් නැතිවීම සහ නව ලිබරල්වාදයට සමාජවාදී විවේචනයක් සහ විකල්ප සිතීමක් නොමැති වීම අප රටට පමණක් සීමාවූ ගැටලුවක් නොවේ. එබැවින් සමහර වාමාංශිකයන් කරන්නේ, චීනයේ අමෙරිකානු විරෝධී විවේචන මත නව ලිබරල්වාදය පිළිබඳ තම ප්‍රතිචාරය ගොඩ නැගීමයි. එය අසම්පූර්ණ එරෙහිවීමකි.

# විචාර විකල්ප

මෙම පසුබිම තුළ නව ලිබරල්වාදයට එරෙහි වීමේ විවේචනයක් ගොඩනැගීමේදී ඒ සඳහා ගැඹුරට ගවේෂණය කළ හැකි විකල්ප සිතීමේ ඉදිරි දර්ශන හතරක් ගැන කෙනකුට සිතාගත හැකිය. මේවා ලෝකයේ දැනට සිදුවන කතාබහ සහ සාකච්ඡා තුළින් යෝජනා වන ඒවාය. ඒවා නම්,

* කම්කරු, ගොවි සහ පීඩිත ජනතාවගේ දෘෂ්ටිකෝණයෙන් ගොඩ නගන නව සමාජවාදී විකල්පයක් මත පදනම් වූ නව-ලිබරල් යුගයේ ධනවාදය පිළිබඳ විවේචනයක්.

*සුභසාධන ධනවාදය යළි ගොඩ නැගීමේ සමාජ ලිබරල්වාදී සිතීමක්.

* සමාජවාදී මූලෝපායක් සමග සම්බන්ධ කරගත් රැඩිකල් ප්‍රජාතන්ත්‍රවාදී සිතීමක්.

*කල්පවිනාශවාදී මතවාදයක් මත ගොඩනගන නව මානුෂවාදී ලෝක දෘෂ්ටියක්.

මෙම විකල්ප සිතීම් හතර, එකිනෙකට ඍජුව සම්බන්ධ නැතත්, ඒවා අතර එකිනෙක හරහා යන සම්බන්ධතා තිබේ. මෙම ඉදිරි දැක්මවල් මත සමාජ ව්‍යාපාර සහ සන්ධාන ගොඩනැගීමේදී එම දැක්මවල් අතර තිබෙන මෙම ලක්ෂණය ගැන මතක තබා ගැනීම බෙහෙවින් ප්‍රයෝජනවත්ය.

## සමාජවාදී විකල්ප සිතීම

සම්භාව්‍ය මෙන්ම නව-ලිබරල්වාදයේ ආරක්ෂා කරන, ධනවාදී ආර්ථික, සමාජ සහ දේශපාලන ක්‍රමය ගැන පරිපූර්ණ විවේචනයක් තවමත් තිබෙන්නේ මාක්ස්වාදී සමාජවාදයෙහිය. එය මූලික වශයෙන් කම්කරු පන්තිය සහ වැඩ කරන ජනතාව ධනවාදී ක්‍රමය තුළ පත්වන සූරාකෑම සහ පීඩනය පිළිබඳ දෘෂ්ටිකෝණයෙන් ගොඩනගනු ලැබූවකි. අතිරික්ත වටිනාකම නිෂ්පාදනය කිරීම සහ ලාභ උපරිම කිරීම ඉලක්ක කරගත්, පුද්ගලික දේපොළ හිමිකම පදනම් කරගත් ධනවාදී ආර්ථික ක්‍රමය කම්කරු ජනතාවට, ගොවි ජනතාවට සහ සියලු වැඩකරන ජනතාවට දුගීකම සහ දුක්ඛිතභාවය සහතික කරන ක්‍රමයක්ය යන්න ධනවාදී ක්‍රමය පිළිබඳව ඇති සම්භාව්‍ය මාක්ස්වාදී විවේචනයේ හරයයි. විසිවැනි සියවස තුළ සුභසාධන තුළ ධනපති ක්‍රමයේ තිබි එම සූරාකෑමේ සහ දරිද්‍රතාව නිර්මාණය කිරීමේ හැකියාව සිමාවී, දියුණු කාර්මික සමාජවල කම්කරු පන්තියේ ජීවන තත්වය සහ වැටුප් ඉහළ යාමක් සිදුවී තිබිණ. ඒවා සියවස් දෙකක පමණ කම්කරු අරගලවලද ප්‍රතිඵල විය.

එහෙත්, නව-ලිබරල්වාදී ප්‍රතිසංස්කරණ යටතේ සුභසාධන ධනවාදය අවසන් කෙරිණ. නිදහස් වෙළෙඳපොළ මතවාදය යළි හඳුන්වාදීම සමග කම්කරු පන්තිය දිනාගෙන සිටි ආර්ථික සහ සමාජ රැකවරණ දැන් බිඳ වැටී තිබේ. දියුණු ධනවාදී රටවල මෙන්ම සංවර්ධනය වන රටවලද රැකියා හිඟය, රැකියාවල අස්ථාවරතාව, වෘත්තීය සමිති මර්දනය, කෘෂිකර්මයේ ශීඝ්‍ර ධනවාදී ව්‍යාප්තිය සහ ගොවි ජනතාව අතර පැතිරෙන ආර්ථික අනාරක්ෂාව වැනි නව සමාජ-ආර්ථික ගැටලු මතුවී තිබේ. ශක්තිමත් සමාජවාදී ව්‍යාපාර නැති වීමේ පසුබිම තුළ කම්කරු පන්තිය අතර ජාතිවාදය සහ ජනකාන්තවාදය වැනි දක්ෂිණාංශික දේශපාලන ප්‍රවණතා වර්ධනය වීමද සිදුවේ.

කම්කරු පන්තියේ ආර්ථික සහ දේශපාලන ඉල්ලීම් මත පදනම් වන කම්කරු පන්ති ව්‍යාපාරයක් කේන්ද්‍රකොටගත් දීර්ඝකාලීන පරිවර්තනීය ඉලක්ක සහිත නව සමාජවාදී ව්‍යාපාරවල ඓතිහාසික අවශ්‍යතාව පැන නැගී තිබෙන්නේ මෙම පසුබිම තුළය. එහෙත් මෙතැනදී මතුවන ගැටලුවක් නම් සෝවියට් දේශය, නැගෙනහිර යුරෝපය සහ චීනය ආකාරයේ පැරණි සමාජවාදී දේශපාලන සහ රාජ්‍ය මාදිලියට, නව ලිබරල්වාදයට විකල්පයක් වීමට දැන් ඓතිහාසික අවකාශයක් නොවීමයි. දේශපාලන ප්‍රජාතන්ත්‍රවාදය, ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය සහ සමාජීය ප්‍රජාතන්ත්‍රවාදය සහිත නව සමාජවාදී මාදිලියක් පරිකල්පනය නොකර, නව-ලිබරල්වාදයට සමාජවාදී විකල්පයක් ගොඩනැගිය නොහැකිය. සමාජවාදී විකල්පය කුමක් විය යුතුදැයි අලුතින් සිතීමේ වගකීමද, නව-ලිබරල්වාදය ප්‍රතික්ෂේප කරමින් විවේචනය කරමන සමාජවාදීන් ඉදිරියේ තිබෙන්නේ එබැවිනි. එය ඉදිරි සාකච්ඡාවකට සුදුසු තේමාවකි.

## සුභසාධනවාදී ධනවාදයක් සඳහා සිතීමක්

මෙම සිතීම් මාදිලියේ මූලික උපකල්පනය වන්නේ, ධනවාදයේ ව්‍යාප්තියේ වර්තමාන නව-ලිබරල්වාදී අවධිය ආපසු හරවා, නව ලිබරල් ධනවාදයේ විශේෂයෙනුත්, ධනවාදී ක්‍රමයේ පොදුවේත් ඇති නිෂේධනීය සමාජ ප්‍රතිඵල

ධනවාදය ඇතුළතම පාලනය කිරීමේ ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතියක් ලෝකයට අවශ්‍ය වේය යන්නයි. එය ධනවාදය සමාජ-ආර්ථික ක්‍රමයක් ලෙස අහෝසි කිරීම නොව, එය සමාජ සුභසාධනවාදී රාමුවක් තුළ රාජ්‍යයට සමාජ කාර්යභාරයක්ද පවරමින් යළි සකස් කිරීමකි. දහනව වැනි සියවසේ අගදී සහ විසිවැනි සියවසේ මුලදී වර්ධනය වූ සමාජීය ලිබරල්වාදය, සුභසාධන ධනවාදය, කේන්ස් සාමිවරයාගේ රාජ්‍ය මැදිහත්වීම්වාදී ආර්ථික ප්‍රතිපත්ති මෙන්ම 1970 ගණන්වලදී ලතින් ඇමෙරිකාව කේන්ද්‍රකොට ගෙන වර්ධනය වූ රාජ්‍ය-ධනවාදී සංවර්ධන මාදිලිය යන ඉගැන්වීම්වල නිර්මාණාත්මක සංයෝගයක් විය හැකිය. කෝවිඩ් වසංගතය විසින් දුර්වල කරනු ලැබ තිබෙන නිදහස්-වෙළෙඳපොළ කේන්ද්‍රීය ලෝක ආර්ථිකය මෙන්ම ජාතික සහ කලාපීය ආර්ථිකයන්ද යළි ගොඩ නැගීමේ, ධනවාදී ආර්ථික, සමාජ සහ දේශපාලන ප්‍රතිසංස්කරණ ක්‍රියාමාර්ග පිළිබඳව අලුතෙන් සිතීමට ඒ මගින් අනුබල ලැබේ.

# රැඩිකල් ප්‍රජාතන්ත්‍රවාදී විකල්පයක් සඳහා සිතීමක්

ධනවාදයට එරෙහිව සමාජවාදී විකල්පය, සමාජවාදය සහ ප්‍රජාතන්ත්‍රවාදය සංයෝග කරමින් අලුතෙන් පරිකල්පනය කිරීමට උනන්දු වන වාමාංශික සහ සමාජවාදී ව්‍යාපාර මෙවැනි නව සිතීමක් සඳහා පෙළඹීමද ඓතිහාසික අවශ්‍යතාවක් වී තිබේ. පසුගිය දශකය පුරාම ලෝකයේ පැතිරුණ, නව ලිබරල්වාදයට විරුද්ධ විරෝධතා ව්‍යාපාරවල දේශපාලන ශක්‍යතාව මත එවැනි නව සිතීමක් ගොඩනැගිය හැකිය. එමෙන්ම එම නව සිතීම, යුරෝපීය කම්කරු සහ ප්‍රගතිශීලී ව්‍යාපාර අතර පැතිරුණු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී චින්තනය රැඩිකල්කරණයට පාත්‍ර කිරීමකටද ඉඩ සලසයි. සමාජවාදී රාජ්‍ය ක්‍රමයක් වෙතින් ධනවාදී ක්‍රමය ඉවත් කරනු ලැබීමේ විකල්පය පිළිබඳ අදහසට ඓතිහාසික වලංගුතාවක් දැනට නොමැති තත්වයක් තුළ, සමාජවාදී සමානත්වය පිළිබඳ අදහස දේශපාලන ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ අදහසද සමග සංයෝග කරන රැඩිකල් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී විකල්පයක් සඳහා සිතීමට එයින් අනුබල ලැබේ. ධනවාදී ආර්ථික අසමානතා, දේශපාලන අධිකාරවාදය සහ සෑම ආකාරයකම සමාජ පීඩනය තුරන් කිරීම මෙන්ම නිදහස, අයිතිවාසිකම්, සමානත්වය, සමාජ සහ දේශපාලන බහුත්වවාදය යන මේ පරමාදර්ශ දේශපාලන අරගල තුළට ගෙන ඒමේ හැකියාවද ඒ මගින් අවධාරණය කළ හැකිය.

# 'කල්ප විනාශවාදී' චින්තනයක් සහිත මානුෂවාදී විකල්පයක්

'කල්ප විනාශවාදය' යන පදය සාම්ප්‍රදායිකව යොදාගනු ලැබුවේ 'ලෝකයේ අවසානය ළඟ එනවාය' යන මනඃකල්පිත භීතිය ඇතිකරන ආගමිකවාදී මතවාද හැඳින්වීමටය. 'ලෝක විනාශය අත ළඟයි, ඒ සඳහා සූදානම් වන්න' යන මෙම ආගමිකවාදී පණිවුඩයම, පරිසරවාදීන් විසින් දැන් මනඃකල්පිත කොට, ඓතිහාසික වශයෙන් සිදුවිය හැකි අර්ථයක් ලබා දෙනු ලැබ තිබේ. 'පරිසර විනාශය සහ දේශගුණික අර්බුද නිසා මනුෂ්‍ය ශිෂ්ටාචාරයම අනතුරේ' යන නව සටන්පාඨය තවදුරටත් කල්ප විනාශවාදී සිහිනයක් හෝ පරිසර රොමෑන්තිකවාදීනගේ ව්‍යාපාරයක් නොවේ. එය ලෝකයේ මතුවී තිබෙන නව විචාරාත්මක දේශපාලන අවබෝධයක අංගයකි. එහෙත් ගැටලුව වී තිබෙන්නේ, එම කරුණ ඍජුව සම්බන්ධ වී තිබෙන අධිපති ආර්ථික සහ දේශපාලන මාදිලින්ද ප්‍රතිසංස්කරණය නොකිරීමයි. දැනට ලෝකයේ පවත්නා පරිසරවාදී සහ ජෛවී මිත්‍රවාදී විඥානය, නව ලිබරල් ධනවාදයට මෙන්ම අනෙකුත් ආර්ථික මාදිලීන් පිළිබඳවද රැඩිකල්-මානුෂවාදී විවේචනයක් ගොඩනැගිය හැකි

දේශපාලන අවබෝධයක් බවට පරිවර්තනය කිරීම මෙවැනි නව සිතීමකින් අපේක්ෂා කළ හැකිය. මනුෂ්‍ය ශිෂ්ටාචාරයේ අනාගතය පිළිබඳ ප්‍රශ්නය ඇමෙරිකාවට එරෙහිව චීනය යන පටු ද්විභේදන රාමුවෙන් එළියට ගැනීමටද එවැනි නව සිතීමක් අවශ්‍යය.

නව ලිබරල්වාදයට එරෙහි වීම යනු සරල සටන් පාඨවලින් ඔබ්බට ගෙන යා යුතු පරිවර්තනීය දේශපාලන කාර්යයකි. එවැනි ඉදිරියට යෑමක් සඳහා අවශ්‍ය විඥාන සහ අවබෝධ ධාරා ලෝකයේ දැනට ගොඩ නැගී තිබේ. කලළ යුතුව තිබෙන්නේ ඒවා තවදුරටත් වර්ධනය කර, හරවත් ලෙසට රැඩිකල් දේශපාලන විකල්ප ගැනද සිතීමයි■.